## පළමුවන දේව ප්‍රකාශනය

ද්විතීය නීති සංග්‍රහය 4:32-34, 39-40

ද්විතීය නීති සංග්‍රහය පොතෙන් උපුටා ගත් කොටසකි.

**(ඉහළ අහසේ ද පහත පොළොවේ ද ස්වාමින් වහන්සේ දෙවියන් වහන්සේම වන සේක.)**

තවද, දෙවියන් වහන්සේ මිහි පිට මිනිසා මැවූ දා සිට මේ දක්වා ගෙවී ගිය දීර්ඝ කාලය තුළ වේවා, අහසේ එක් කොණක සිට අනෙක් කොණ දක්වා වේවා, මෙයාකාර මහා දෙයක් සිදුවූ බවක් හෝ එවැන්නක් ගැන ඇසූ බවක් හෝ දැන ගන්නට තිබේද? ගින්න මැද සිට කතා කළ දෙවියන් වහන්සේට ඔබ සවන් දුන්නාක් මෙන් කිසියම් සෙනගක් උන් වහන්සේගේ හඬට සවන් දී ජීවත්ව සිටිත් ද? ඔබ බලා සිටියදී ම මිසරයේ දී ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට කළ සියල්ල අනුව වෙන කිසියම් දෙවි කෙනෙක් අභියෝග දක්වා, හාස්කම් සහ අරුම පුදුම දේ පා, යුද්ධයෙන් ද බාහු බලයෙන් හා දිගු කළ හස්තයෙන් ද මහා බිය ජනක දේ කර, එක් ජාතියක් තවත් ජාතියක් මධ්‍යයෙන් තෝරා ගන්නට වැඩිය සේක්ද? එබැවින් සමිඳාණන් වහන්සේ ඉහළ ස්වර්ගයෙහිත්, පහළ මිහිපිටත් වැඩ වසන දෙවියන් වහන්සේ බවත් උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙකු නැති බවත්, මෙදින වටහා ගෙන තරයේ සිතින් මෙනෙහි කරන්න. ඔබට ද, ඔබෙන් පසු ඔබේ පෙළපතට ද ශුභ සිද්ධිය සැලසෙනු පිණිසත්, දෙවි සමිඳාණන් වහන්සේ ඔබ හට සදහට ම දනය කරන දේශයෙහි ඔබ දීඝායු වළඳන පිණිසත්, මා ඔබට අද දින අණ කරන උන් වහන්සේගේ නීති සහ නියෝග ඔබ පිළිපැදිය යුතු ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 33:4-6,9,18-20,22

පිළිතුර: දෙවිඳාණෝ සතු සෙනඟ ආසිරි ලද්දෝ ය.

ගීය: සමිඳුන්ගේ වචනය අවංක ය. එතුමන්ගේ ක්‍රියා සියල්ලක් ම විශ්වාසශීලි ය. දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය. මහ පොළව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

හිමි තුමන්ගේ වචනයෙන් ආකාශය ද එතුමන්ගේ හුස්මෙන් සියලු ආකාශ වස්තූහු ද මවනු ලැබූහ. මන්ද, එතුමාණෝ වචනයෙන් සියල්ල මවන සේක. ආඥාවකින් සියල්ල තහවුරු කරන සේක.

දේව කරුණාව ඇත්තෙනි, දේව භය පතන්න. මරණයෙන් ගළවන පිණිස ද දුබික් දුරුකොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක. අපි හිමිතුමන් කෙරේ විශ්වාසයෙන් බලා සිටියෙමු.

අපේ පිහිටත් පළිහත් එතුමාණෝ ය. සමිඳුනි, ඔබ කෙරේ අපේ බලාපොරොත්තු පිහිටෙවු ලෙස ම ඔබේ කරුණාව අප කෙරෙහි වේවා!.

## දෙවන දේව ප්‍රකාශනය

රෝම 8:14-17

පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(පියාණෙනි, කියා දෙවියන් වහන්සේ ඇමතීමට ඉඩ ඇති දරු කමේ උරුමය ඔබ ලබා ඇත.)**

දේවාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. මන්ද, ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්වය නොව, "අබ්බා පියාණෙනි" යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්වයකි. අපි දෙවියන් වහන්සේගේ දරුවන් බවට ශුද්ධාත්මයාණෝ ම අප ආත්මය හා එක්ව සාක්ෂි දරති. අපි දරුවෝ නම් උරුමක්කාරයෝ ද වම්හ. දෙවියන් වහන්සේගේ උරුමක්කාරයෝ ද ක්‍රිස්තුස් වහන්සේ හා සමඟ හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද, දැන් උන් වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන්, අනාගතයේ දී උන් වහන්සේගේ මහිමයේ පංගුකාරයෝ ද වම්හ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුසුවත් ජය නද

එළිදරව්ව 1:8

ආලේලූයා! ආලේලූයා!
"ආරම්භය ද අවසානය ද මම වෙමි"යි වැඩ සිටින, වැඩ සිටිය, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමීන් වන දෙවියන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 28:16-20

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බෞතිස්ම-ස්නාපනය කරන්න."**

ශ්‍රාවකයෝ එකොළොස් දෙනා ජේසුස් වහන්සේ ඔවුන්ට නියම කළ පරිදි ගලීලයේ කන්දට ගියහ. ඔව්හු උන්වහන්සේ දැක පසඟ පිහිටුවා වැන්දේය. එහෙත් සමහරෙක් සැක කළහ. ජේසුස් වහන්සේ ඔවුන් වෙතට අවුත් කතා කොට, "ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට පවරා තිබේ. එබැවින් ඔබ ගොස්, සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න. පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මම ද යුගාන්තය දක්වා සදහට ම ඔබ හා සමඟ සිටිමි" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.